**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2020**

**-------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධපාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව,ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.57,441,349 ක් වූ ජංගම නොවන වත්කම් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ ජංගම නොවන වත්කම්වලට අදාළ ප්‍රත්‍යාගණන වාර්තා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබුණු පසු ජංගම නොවන වත්කම් සඳහා ලේඛනයක් පිළියෙල කරනු ලබන අතර එහිදි තවදුරටත් භාවිතයට ගනු ලබන වත්කම් ප්‍රතිශෝධනය වේ. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා දරන ලද රු.1,097,477 ක වියදම අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනීමකින් තොරව පුස්තකාල පොත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | භූ තාපයෙන් විදුලිය නිපදවන පර්යේෂණ ව්‍යාපෘතිය පුස්තකාල පොත් යටතේ ගිණුම්ගත කර ඇත. | පර්යේෂණ සහ සංවර්ධන පිරිවැය ගිණුම්ගත කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රමිතය අනුව කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | **පනත්** | | | |
| | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය | 2019 වර්ෂයට අදාළව අවසන් වාර්ෂික වාර්තාව හා සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2021 මාර්තු මාසය වන විටත් පිළියෙල කර නොතිබුණි. | 2019 වාර්ෂික වාර්තාව පාලක මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර හැකි ඉක්මණින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට සටහන් කරගෙන ඇත. | මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | i. මුදල් රෙගුලාසි 756 | සෑම වර්ෂයකම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළයුතු වුවත්, ජාතික මූලික අධ්‍යයන ආයතනයට අයත් පුස්තකාලයේ 2019 වර්ෂයේ සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි. | මේ සඳහා කමිටුවක් පත් කර ඇති බවත්, කමිටුව මඟින් පුස්තකාලයේ පොත් සමීක්ෂණ සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මුදල් රෙගුලාසි 756 (2) | ආයතනයේ 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු මුදල් රෙගුලාසිවලට අනුකූල නොවන පරිදි ගබඩා භාරකරු ඇතුළුව ආයතනයේම නිලධාරීන් 06 දෙනෙකු යොදාගෙන සිදු කර තිබුණි. | මින් ඉදිරියට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමේදී ජාතික මූලික අධ්‍යයන ආයතනයේ නිලධාරීන්ට අමතරව වෙනත් රාජ්‍ය ආයතනයක නිලධාරීන්ද සම්බන්ධ කර ගැනීමට සටහන් කරගන්නා ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) චක්‍රලේඛ

----------

| | | | |
|---|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.1,073,884,363 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | Covid 19 වසංගත තත්ත්වය ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන වාර්තා ලැබීමේ ප්‍රමාදයන් පවතින හෙයින් එම ප්‍රත්‍යාගණන වාර්තා ලද විගස අදාළ නව අගයන් ඇතුළත් කොට ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.65,293,445 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.79,413,103 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,119,658ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන හා වෙනත් ආදායම් වැඩි වීම හා සැපයුම්, පරිභෝජන හා නඩත්තු වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික මූලික අධ්‍යයන ආයතනය වෙත අක්කර 14, රූඩ් 02, පර්චස් 17.5 ක වපසරියකින් යුතු හන්තාන වතු යායට අයත් ඉඩම ජාතික වතු සංවර්ධන මණ්ඩලය විසින් 1990 | 1990 ජූනි මස 30 වන දින නිවාස සංවර්ධන අධිකාරියේ මෙම ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ලියවිල්ලක් පමණක් ලබාදී ඇති බවත්, 2021 මාර්තු 20 වන දින පැවති පාලක මණ්ඩල | ඉඩමේ අයිතිය නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ජූනි 08 දින පවරා දී ඇතත්, එහි නිත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | රැස්වීමට මෙම ගැටලුව ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරීමට අප ආයතනයේ නීතිඥවරියට උපදෙස් ලබාදී ඇත. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.125,571,722 ක් වටිනා ස්ථාවර තැන්පතු 24 ක් කල් පිරීමේදී අනිකුත් වාණිජ බැංකුවලින් මිල ගණන් කැඳවීමක් නොමැතිව එම බැංකුවේම ආයෝජනය කර තිබුණි. | 2017 වර්ෂයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව, මහජන බැංකුව සහ ලංකා බැංකුව වෙතින්ද පොලී අනුපාතික මිල ගණන් කැඳවීමක් කර ඇති බවත් එහෙත් ඉදිරියේදී රජයේ අනෙකුත් බැංකු වෙතින්ද මිල ගණන් පරීක්ෂා කිරීමට සටහන් තබා ගන්නා ලදි. | මිල ගණන් කැඳවා වඩාත් ආර්ථිකමය වාසි අත්වන බැංකුවක ආයෝජනය කළ යුතුය. |
| (ආ) | 2018 සිට 2020 වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ රු. මිලියන 566.6 ක ඇස්තමේන්තුගත අගයක් වූ පර්යේෂණ ව්‍යාපෘති යෝජනා 05 ක් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ අනුමැතිය නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. | පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත."Kandy Lake Protection to Ensure its Natural Beauty and Cultural Wealth" සඳහා සංශෝධිත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබූ අතර එයටද මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැත. | අදාළ අනුමැතිය ලබා ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ පේටන්ට් (Patents) බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතීන් 02 ක් සඳහා පමණක් පේටන්ට් (Patents) බලපත්‍ර ලබා ගැනීමට අනුමැතිය ලැබී ඇත. | පේටන්ට් (Patents) බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතුය. |
| (ඈ) | ජාතික මූලික අධ්‍යයන ආයතනය සඳහා Integrated Software පද්ධතියක් ස්ථාපිත කිරීමට පුද්ගලික ආයතනයක් සමග 2016 මාර්තු 28 දින ගිවිසුම්ගත වුවත් අදාළ පද්ධතිය ස්ථාපිත නොකිරීම හේතුවෙන් නැවත 2018 මාර්තු 26 දින ගිවිසුමකට එළඹ තිබුණි. ආයතනය විසින් රු.660,000 ක මුදලක් අත්තිකාරම් වශයෙන් හා රු.6,864,960 ක මුදලක් පරිගණක හා උපාංග මිලදී ගැනීම සඳහා වැය කර ඇතත්, සමාලෝචිත වර්ෂය | 2021 පෙබරවාරි 20 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී ඉදිරි මාස 03 ඇතුළත මෙම පද්ධතියේ කටයුතු නිම කිරීමට උපදෙස් ලබා දුන් බවත් තවද 2020 දෙසැම්බර් 20 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි අදාළ සමාගම නැවත ගිවිසුමකට එළඹීමට ප්‍රතික්ෂේප කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව මෙම පද්ධතියේ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

අවසානය වන විටත් එම පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 9.10 ඡේදය ප්‍රකාරව, කාර්යය මණ්ඩලය කළමනාකරණය කිරීමේදී කෙටිකාලයක් තුළ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු බව දක්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දිනට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ කාර්යය මණ්ඩලය තුළ තනතුරු 09 ක පුරප්පාඩු 27 ක් පැවතුණි. ඉන් නිලධාරීන් 17 දෙනෙකුම පර්යේෂණ කාර්යය මණ්ඩලය වූයෙන් පර්යේෂණ කටයුතු වෙනුවෙන් පිහිටුවා ඇති ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මූලික අරමුණු ළඟා කර ගැනීමට අපහසු වී තිබුණි. | රියදුරු/කාර්යාල කාර්යය සහායක තනතුරු හැර සෙසු තනතුරු සඳහා බඳවා ගැනීමට රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපි යොමු කර ඇති අතර එම අනුමැතිය ලද විගස කඩිනමින් බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතව ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**3.4 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංචිත වාහන 06 ක් පැවති අතර ඒ සඳහා රියදුරන් තිදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. එම නිසා ආයතනයේ දෛනික කටයුතු කාර්යක්ෂමව පත්වාගෙන යාමට එම තත්ත්වය බාධාවක් වී තිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2010 හී VIII පරිච්ඡේදයෙහි ප්‍රකාරව ප්‍රාථමික සේවා ශ්‍රේණියේ (PL-01) තනතුරු සඳහා අවශ්‍ය සේවක පිරිස් ජනාධිපති බහු කාර්යය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවෙන් ලබාදීමට තීරණය කර ඇති බැවින් එම උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. | ආයතනයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කළ හැකි වන පරිදි කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර එම සැලැස්ම වාර්තා කොට යාවත්කාලීන කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය සටහන් තබා ගන්නා ලදි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මාස10 කට වැඩි කාල පරිච්ඡේදයක් අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩු වී තිබූ නමුත් ඒ සඳහා සුදුසු අයකු බඳවා ගෙන නොතිබූ අතර එකී කාල පරිච්ඡේදය තුළ ආයතනයේ කිසිදු අභ්‍යන්තර විගණනයක්ද සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිලධාරී බඳවා ගැනීමේ කටයුතු අවසන් අදියරේ ඇත. | අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන අභ්‍යන්තර විගණන කටයුතු පවත්වාගෙන යා යුතුය. |

## 4.3 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයවැයගත වියදම් සහ සත්‍ය වියදම් සැසඳීමේදී වියදම් විෂයයන් 02 ක සියයට 88 සිට සියයට 1158 දක්වා වැඩිවීමක්ද, වියදම් විෂයයන් 11 ක සියයට 26 සිට සියයට 98 දක්වා අඩුවීමක්ද නිරීක්ෂණය විය. | අයවැයගත ඇස්තමේන්තු තිබුණ ද ඒ සඳහා මුදාහළ දායකත්වයන් පහළ මට්ටමක තිබුණු බැවින් අයවැයගත වියදම වෙත ළඟා වීමටද නොහැකි විය. මේ නිසා අයවැයගත වියදමට වඩා සත්‍ය වියදම අඩු අගයක් වූ නිසා වියදම් විෂයයන් 11 ක අඩුවීමක් පෙන්නුම් කර ඇත. | තාත්ත්වික අයවැය ඇස්තමේන්තු පිළියෙල කර ඊට අනුගතව කටයුතු කිරීම කෙරෙහි කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) | ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයයන් 05 ක් සඳහා දරන ලද රු.22,848,617 ක වියදම් වෙනුවෙන් අයවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | එම වියදම් ඇත්තේ පසුගිය වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සඳහා ලද ප්‍රාග්ධන දායක මුදල්වලින් නිසා එම වියදම පමණක් අවසාන ගිණුම්වල පෙන්වා ඇති අතර එම වියදම් සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් නොවීය. | සියලුම වැය විෂයන් ඇතුළත් වන පරිදි අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |